www.agaram.lk

# Royal College - Colombo 07
## රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 - First Term Evaluation – April 2019

## පළමු වාර පරීක්ෂණය – 2019 -අප්‍රේල්- 9 ශ්‍රේණිය

### සිංහල භාෂාව හා සාහිත්‍යය
### Sinhala Language & Literature

කාලය : පැය 2
Time: 2hours

නම..................................................... පන්තිය..................... අංකය.................

- **පහත වාක්‍යවල ඉරි ඇඳි කොටස වෙනුවට යෙදිය හැකි වඩාත් සමීප අර්ථය දෙන ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) තමා කළ ක්‍රියාව පිළිබඳ ඔහු <u>දෙගිඩියාවෙන්</u> පසුවෙයි.

I. කැමැත්තෙන් II. බියෙන් III. සැකයෙන් IV. කලබලයෙන්

(2) මසුරු මිනිසකුගෙන් <u>අතමාරුවක්</u> ගැනීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ.

I. උපකාරයක් II. මාරු කාසි III. ණය මුදලක් IV. විශාල මුදලක්

(3) අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යොදා ඇති පිළිතුර තෝරන්න.

I. විශේෂ , ශිෂ්‍යයා, අවශේෂ, විශිෂ්ට
II. කණිෂ්ඨ, ශ්‍රේෂ්ට, ධර්මිෂ්ට, දූෂ්ට
III. නිශ්චල, පශ්චිම, නිශ්ශබ්ද,ශබ්ද
IV. පුස්තකාල, සමස්ත, ප්‍රස්තාර, ප්‍රස්තාව පිරුළු

(4) මූර්ධජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

I. ට, ඨ, ඩ , ඪ , ණ II. ත , ථ , ද ,ධ ,න
III. ප , ඵ , හ , බ ,ම IV. ච , ඡ , ජ , ඣ , ඤ

5) "ප" වර්ගයට අයත් අකුරු ඇතුළත් වචනය තෝරන්න.

I. නවීන II. නරක III. චණ්ඩ IV. පරම

- **පහත සඳහන් වාක්‍ය සඳහා හිස්තැනට ගැළපෙන වචනය තෝරන්න.**

6) දේශනයකට.......................................................... සවන් දීම දේශකයාට කරන ගෞරවයකි.

I. හොඳින් II. සාවධානව III. අවධානයෙන් IV. කැමැත්තෙන්

7) රටේ.......................................... වෙනුවෙන් කැපවීම අප හැමගේම යුතුකමකි.

I. අනුමැතිය II. අභිමතිය III. උන්නතිය IV. පරිණතිය



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

8) දී ඇති පද අතුරින් සමානාර්ථ නොවන පදය ඇතුළත් පිළිතුර තෝරන්න.

I. සඳ , සිසි , තරිඳු , හිමකර   II. වනය , වල , අටවි , අරණ

III. තුට , ආනන්දය , දොම්නස , ප්‍රහර්ෂ   IV. අලුයම, උදෑසන , ප්‍රභාතය , අරුණ

- **මුලින් දී ඇති පදයට විරුද්ධ පදය තෝරන්න.**

9) නූතන - I. නවීන   II. පුරාතන   III. මධ්‍යතන   IV. අද්‍යතන

10) සදොස් - I. නිදොස්   II. අවැඩ   III. නරක   IV. දොස්

**"නවක ලිපිකරුවා වේලාව නොබලා මහන්සියෙන් වැඩ කරයි."**

11) ඉහත වාක්‍යයේ නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද වන්නේ,

I. ලිපිකරුවා - වෙලාව   II. නවක - මහන්සියෙන්

III. නවක - වෙලාව   IV. ලිපිකරුවා - වැඩ කරයි.

12) උක්ත පද දෙකක් පමණක් ඇති පිළිතුර තෝරන්න.

I. ළමයා , මල , ළමයි , අපි   II. ගොවියෝ , ගොවියෙක් , මිනිසකු මිනිසුන්

III. තා , මම , තොප , සමහරුන්   IV. රීතීහු , ගංගාවෝ , තාරකාවෝ , රීතීන්

13) ඉරි ඇඳි පද වල ක්‍රියා වර්ගය පිළිවෙළින් නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

**"තෝත් <u>නටාපිය</u> මාත් නටන්නං**
**සම්මා සම්බුදුවන දා නිවන් <u>දකින්</u> අම්මා**
**පැණි <u>බී</u> හප බිමට දමන්නේ "**

I. විධි ක්‍රියා , ආශිර්වාද ක්‍රියා , පූර්වක්‍රියා   II. විධි ක්‍රියා , පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

III. පූර්ව ක්‍රියා , ආශිර්වාද ක්‍රියා , විධි ක්‍රියා   IV. මිශ්‍ර ක්‍රියා , ආශිර්වාද ක්‍රියා , පූර්ව ක්‍රියා

14) ක්‍රියා රූප දෙකක් එකතු වීමෙන් සැකසුණු යුගල පද ඇතුළත් වරණය තෝරන්න.

I. අඩා දොඩා , කවා පොවා , කා බී , හිතා බලා

II. අඟර දඟර, අබල දුබල , උසුළු විසුළු , දුව පැන

III. ලියන කියන , කන බොන , සිතන පතන , දුවන පනින

IV. ලවක් දෙවක් , උකුළු මුකුළු , ඉඩම් කඩම් , කඩා වඩා

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

- දී ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

15) ඕනෑවට එපාවට කිසියම් වැඩක නිරත වීම

I. හිල් කුඩෙන් වතුර අදින්නා වාගේ.
II. ලෙඩ කපුටා වැළ කන්නා වාගේ
III. පිදුරු ගොඩේ ඉන්නා බල්ලා වාගේ
IV. කළුවා මාරපන් ගියා වාගේ

16) උත්සාහය ඇත්නම් ජයග්‍රහණය ලැබිය හැක.

I. හිත ඇත්නම් පත කුඩා ද?
II. තමන් හිසට තම අතමය සෙවණැල්ල
III. ඉබ්බා දියේ දැම්මා වාගේ
IV. අතු කඩා මොර කනවා වාගේ

**අක්ෂර වර්ණ යනුවෙන් ද හැඳින්වේ.**

17) ඉහත වාක්‍යයේ වර්ණ යන වචනය සඳහා යෙදිය යුතු විරාම ලක්ෂණය වන්නේ කුමක් ද?

I. යුගල උඩු කොමා ( "     ")
II. තනි උඩු කොමාව ( ' )
III. තනි උඩු කොමා ( ' ' )
IV. වරහන ( )

18) පහත පද නිවැරදිව යා කළ විට ලැබෙන පිළිතුර වන්නේ,

| | |
|---|---|
| 1. සකස්කඩ | A සාධාරණ සාපේක්ෂතා වාදය |
| 2. රත්නප්‍රාසාදය | B ලේඛනයේ දී නැවතීම නිරූපනය කරයි |
| 3. ස්ටීවන් හෝකින් | C උච්චාරණය දියුණු කරයි. |
| 4. විරාම ලක්ෂණ | D අභයගිරි විහාරය. |

I. ABCD II. CDAB III.´ACBD IV. BADC

19) රකාරාංශය , ඇලපිල්ල, ගයනුකිත්ත , යංශය , පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,

I. ඖෂධ , ප්‍රභේද , මධ්‍යම , කාර්යාලය
II. ප්‍රභේද , කාර්යාලය , ඖෂධ , මධ්‍යම
III. කාර්යාලය , ඖෂධ , මධ්‍යම , ප්‍රභේද
III. මධ්‍යම , ඖෂධ , කාර්යාලය , ප්‍රභේද

20) **"න භජෙ පාපකේ මිතෙත - න භජෙ පුරිසාධමෙ "** යන්නෙහි අර්ථය වන්නේ,

I. පවිටු මිතුරන් අධම මිනිසුන් වන බවය.
II. පවිටු මිතුරන් හා අධම මිනිසුන් ඇසුරු නොකළ යුතු බවය.
III. අසත්පුරුෂයන් පවිටු මිතුරන් වන බවය.
IV. පවිටු මිනිසුන් මිතුරන් බවට පත්වන බවය.

(ලකුණු 2×20 = 40)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

## Sinhala - Part II
## සිංහල- II කොටස

- 01 හා 02 ප්‍රශ්න අනිවාර්යය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(01) **පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(1) සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර ගණන කොපමණද?

(2) සිංහල අක්ෂර මාලාවට අයත් මහාප්‍රාණ අක්ෂර ගණන කොපමණද?

(3) මහාප්‍රාණ අක්ෂර යෙදුණු වචන 02ක් ලියන්න.

(4) සිංහල අකුරු වර්ගකරන අක්ෂර උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ග 02ක් ලියන්න.

(5) එම අක්ෂර වර්ග දෙකට අයත් අක්ෂර 02 බැගින් උදාහරණ ලියන්න.

(6) සිංහල අක්ෂර මාලාවට අයත් සඤ්ඤක අක්ෂර ගණන කොපමණද?

(7) සඤ්ඤක අකුරු යෙදුණු වචන 02ක් ලියන්න.

(8) වර්ගාක්ෂර විසිපහට ඇතුළත් පළමු අක්ෂර පහ ලියා දක්වන්න.

**(ලකුණු 2x8=16)**

(02) **පහත මාතෘකා වලින් එකක් යටතේ වචන 200 කට පමණ රචනයක් ලියන්න.**

(1) අපද්‍රව්‍ය නිසිලෙස බැහැර කර පරිසරය හා සතුන් රැකගනිමු.

(2) මගේ දේශය තරම් උතුම් දේශයක් ලොව නැත.

(3) ස්ටීවන් හෝකින් ලොවම පිළිගත් අසහාය මිනිසෙකි.

(4) දේශාභිමානි පද්‍ය සාහිත්‍යය ජාතිය පණ ගන්වයි.

(5) රූපවාහිනිය දැනුම ලැබීමේ මාධ්‍යයක් ලෙස සලකමු. **(ලකුණු 14)**

(03) ඔබගේ ශිෂ්‍ය තොරතුරු ඇසුරින් ආකෘති පත්‍රයක් නිර්මාණය කරන්න. (සම්පූර්ණ නම, ලිපිනය , උපන් දිනය, අධ්‍යාපනය ලබන පාසල , ලබා ගත් ජයග්‍රහණ , ක්‍රීඩා කුසලතා ආදිය ඇතුළත් විය යුතු ය.)

(ලකුණු 10)

(4) **පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

බන්දා විජය දද අකනිට පද හිම්මේ
සින්දා හළ එතෙක් රිපු සිරිලක් අම්මේ
අන්දා ඔබගෙ සිතියම හද මිණි බැම්මේ
වැන්දා මෙන්න මුදුනත් නගමින් දම්මේ



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

කරුණා මහිම කොයි තරම ද කිවොත් ඔබේ
මැවුණා මහා ගංගාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ

(1) මෙම පද්‍යයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?
(2) පද්‍යයට අනුව මහා ගංගාවල් ලෙස මැවුණේ මොනවා ද?
(3) මව් බිමට නමස්කාර කරන බව දැක්වෙන පද පේළිය උපුටා දක්වන්න.
(4) පද්‍ය නිර්මාණයේ එන කාව්‍යාලංකාර අතරින් එළිවැට/එළිසමය දැක්වෙන පද දෙකක් දක්වන්න.
(5) 'මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ.' යන්නෙහි අර්ථය ලියන්න.

**(ලකුණු 2x5=10)**

(5) **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සැබෑ මානව හිතවාදී ගුණයෙන් පිරිපුන් සරත්චන්ද්‍ර මහතා මහාචාර්යවරයෙකු පමණක් නොව නූතන සිංහල නාට්‍ය කලාවේ අසහාය යුග පුරුෂයා ද වෙයි. එතුමා අතින් රචනා වූ නාට්‍ය සම්භාරය ද අතිවිශාලය. මුල් කාලයේ දී එතුමා උත්සාහ කළේ අපේ රටේ ගැමි කතා, ජනකතා ඇසුරු කර ගනිමින් නාට්‍ය රචනා කිරීමටය. රත්තරං , ඒකට මට හිනා, හස්ති කාන්ත මන්තරේ, එලොව ගිහින් මෙලොව ආවා යන නාට්‍ය මේ අතර වේ. එතුමාගේ නාට්‍ය අතර වැදගත්ම නිර්මාණය ලෙස සැලකෙන්නේ මනමේ නාටකයයි. මනමේ නාටකයෙන් පසුව සිංහබාහු , වෙස්සන්තර , ලෝමහංස , ප්‍රේමතෝ ජායති සෝකෝ වැනි උසස් නාට්‍ය ද රචනා කරන ලදී. එපමණක් නොව මෙරට ගුවන් විදුලි නාට්‍යය කලාව වෙනුවෙන් ද එතුමා විපුල මෙහෙයක් ඉටු කරන ලද අතර නෑදෑයෝ , ගත්කරු පිස්සුව , ඈ නුවන් ලැබුවා එබඳු ගුවන්විදුලි නාට්‍යය කීපයකි.

1) සරත්චන්ද්‍රයන්ගේ මුල් කාලීන නාට්‍යවලට පදනම් වූයේ කුමක් ද?
2) එතුමා මුල් කාලයේ රචනා කළ නාට්‍යය දෙකක් සඳහන් කරන්න.
3) එතුමාගේ උසස් ම නාට්‍ය නිර්මාණය කුමක් ද?
4) එතුමා ලියූ ගුවන් විදුලි නාට්‍ය දෙකක් ලියන්න.
5) ඡේදයට අනුව සරත්චන්ද්‍රයන් හඳුන්වන විශේෂ නාමය කුමක්දැයි ලියා දක්වන්න.

**(ලකුණු 2x5=10)**

(6) **i. නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

1) මඟ සලකුණු නොසලකා ..........................ගිය පිරිස බොරු .............. වැටී තුවාල ලැබූහ. ( වලට / වළට )
2) නගරයේ දුගී ..........................එතනට පැමිණි ප්‍රභුවරුන්ට .............. නමා ආයාචනා කළහ. ( දන / දණ )
3) ..........................අලියාගේ එක් පාදයක් .............. වී තිබෙනු දුටු පිරිස කනගාටු වූහ. ( වන / වණ )
4) තමාගේ ගොයම් .......................... විනාශ වී ඇති අයුරු දුටු ගොවියා .............. දෙසට ගියේ සොවින් තැවෙමිනි. ( පැල / පැළ )
5) කඳු අතරින් වේගයෙන් ගලා යන .......................... පාර වනයේ දකුණු .............. යෙන් ගම්මානයට පිවිසෙයි. ( ඇල / ඇළ )

→



agaram.lk

www.agaram.lk

**ii. සිංහල භාෂාව රසවත් කරන සාම්ප්‍රදායික යෙදුම් පිළිබඳ දැනුම ඇසුරින් පහත හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

6) යම්කිසි සිදුවීමක් මුල්කොටගෙන සෑදුණු අවස්ථාවට උචිත කියමන් ............................. ලෙස හඳුන්වන්නෙමු.

7) ............................. යනු බහුශ්‍රැතයන් විසින් දෙනු ලබන උපදෙස් ය.

8) වචනයෙන් කියවෙන අර්ථයට වඩා වෙනස් අරුතක් ගෙනදෙන යෙදුම් හඳුන්වන්නේ ............................. නමිනි.

9) සැමවිටම පද දෙකක් එක ළඟ යෙදී බස රසවත් කරන යෙදුම් වන්නේ ............................. ය.

10) යම්කිසි පුද්ගලයෙකුට හෝ වස්තුවකට වෙනත් දෙයක් සමාන කර දැක්වීම ............................. නම් වේ.

(උපමා , ඉඟි වැකි , යුගල පද , ආප්තෝපදේශ , ප්‍රස්තාව පිරුළු)

**(ලකුණු 1x10=10)**

(7) **පෙළපොතේ පාඩම් ඇසුරින් දක්වා ඇති ප්‍රකාශ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

**ශ්‍රී ලංකාවේ නර්තන කලාව වඩවඩාත් දේශීය නර්තන , ගායන , වාදන අංශ තුළින් ප්‍රතිපෝෂණය කිරීමට කැප වූ මහා පුරුෂයා මෙතුමා ය.**

1) මෙහි කියවෙන කලාකරුවා කවුද?
2) ජාතික නර්තන දිනය සඳහන්කර, එම දිනය ඒ සඳහා යෙදීමට හේතුවූ කාරණාව ලියන්න.
3) මෙතුමාට නර්තන ශිල්පියෙකු වීමට ශිල්ප ලබාදුන් ගුරුවරුන් දෙදෙනෙකු නම් කරන්න.
4) **"සියබස කෙලෙසා අපට - නිදහසක් නොම ලැබේ** "යනුවෙන් පැවසූ කවියාගේ නම ලියන්න.
5) **"මී මී පැණි පැණි වද වද රොද රොද** " යන ගී කණ්ඩයේ සජීවී හා ප්‍රාණවත් බව මතුකරන කාව්‍යාලංකාරය කුමක්ද?
6) දේශාභිමානී සාහිත්‍ය නිර්මාණකරුවන් දෙදෙනෙකු නම් කරන්න.

7) ප්‍රවෘත්තියක් කියැවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 02ක් ලියන්න.

ලපසේ සඳ විලසේ දවසක් වෙන්නුවෙ        මීමා
.................................................................
සැපසේ අප දත් දුන්නෙත් වැදුවෙත් වද අ        මීමා
.................................................................

(8) කවියේ ඉතිරි පේළි සම්පූර්ණ කරන්න.
(9) කවිය උපුටාගත් කෘතියේ නම් ලියන්න.
(10) පද්‍යයේ එන ගැමි වහර සහිත වචන 02ක් ලියන්න.

**(ලකුණු 1x10=10)**



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!